# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2373/34 – 2024 පෙබරවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා – 2024.02.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 06, කණ්ඩලම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ මිනීඔළුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක GA/MEE/2021/478 හා 2022.01.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර "A1" – ප්‍රමාණය: හෙක්. 0.0076**

උතුරට: 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 110, 106, 107 සහ 108 වැනි බිම් කැබලි; නැගෙනහිරට: 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 108 වැනි බිම් කැබැල්ල සහ මෙම අනුරේඛනයේ A2 වැනි බිම් කැබැල්ල; දකුණට: A2 වැනි බිම් කැබැල්ල; බටහිරට: 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 110, 106 සහ 107 වැනි බිම් කැබලි.

02. **කැබලි අක්ෂර "A2" – කුරියන්කොටුව – ප්‍රමාණය: හෙක්. 0.1030**

උතුරට: A1 වැනි බිම් කැබැල්ල, 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 108 වැනි බිම් කැබැල්ල සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ 510345 වැනි කඩඉම් සිතියමේ 7 වැනි කලාපයේ 1 වැනි බිම් කැබැල්ල; දකුණට: 510345 වැනි කඩඉම් සිතියමේ 7 වැනි කලාපයේ 1 වැනි බිම් කැබැල්ල; බටහිරට: 510345 වැනි කඩඉම් සිතියමේ 6 වැනි කලාපයේ 110 වැනි බිම් කැබැල්ල සහ මෙම අනුරේඛනයේ A1 වැනි බිම් කැබැල්ල.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2021/HW/242.
2023 ජනවාරි මස 17 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 – 0199



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*